# ප්‍රාකෘත යුගයේ පුද්ගල නාම, ග්‍රාම නාම හා තනතුරු නාම; තෝරාගත් ලෙන් ලිපි ඇසුරින් සිදුකරන විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කේ.පී.අයි.එස්. කරුණානායක**[1]

මුඛ්‍ය පද: ප්‍රාකෘත යුගය, පුද්ගල නාම, ග්‍රාම නාම, තනතුරු නාම

## හැඳින්වීම

ඕනෑම රටක ඉතිහාසය වෙනුවෙන් ඒ ඒ රාජ්‍ය සතුව ඓතිහාසික මූලාශ්‍රය පවතී නම් එරට ඉතිහාසගත කරුණු අනාවරණය සඳහා ඒවා පාදක කර ගැනීම සුලභ කරුණකි. බොහෝ විට සාහිත්‍යමය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස වර්ගීකරණය ආරම්භ වන එම මූලාශ්‍රය තවද අනුශීර්ෂ සියය ඉක්මවා යන සේ පුළුල්ව වර්ගීකරණය කළ හැකිය. එහෙත් මෙම සංග්‍රහය තුළින් බලාපොරොත්තු වන්නේ පුරාවිද්‍යා මූලාශ්‍රයන් යටතේ ගැනෙන අභිලේඛන සාධක සුළු ප්‍රමාණයක තොරතුරු සැකෙවින් දැක්වීමය. මෙහිදී විල්හෙල්ම් ගයිගර් විසින් හඳුන්වා දුන් සිංහලයේ පරිණාමීය යුග බෙදීමේ පළමු යුගය, එනම් ප්‍රාකෘත යුගට (ක්‍රි.පූ. 3/2 සිය. සිට ක්‍රි.ව. 4/5 සිය, දක්වා) අයත් තෝරාගත් ලෙන් ලිපි කිහිපයක් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක් සිදු කරයි. ලංකාවේ පුරාණ ලෙන් ලිපි (බ්‍රාහ්මී ලිපි) මඟින් පැරණි සමාජයේ භාෂා, සංස්කෘතික, ආර්ථික හා දේශපාලන තොරතුරු රැසක් අනාවරණය කරන අතර මෙම ලිපිවල සඳහන් පුද්ගල නාම, ග්‍රාම නාම හා තනතුරු නාම මඟින් එම යුගයේ සමාජ ව්‍යුහය, භූගෝලීය ලක්ෂණ හා පාලන ක්‍රම පිළිබඳ වැදගත් තොරතුරු ලබාගත හැකිය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, තෝරාගත් ලෙන් ලිපි මඟින් මෙම නාමයන්ගේ ලක්ෂණ හා ඒවායේ සමාජමය හා භාෂාමය වැදගත්කම විමර්ශනය කිරීමයි.

## ක්‍රමවේදය

ප්‍රාකෘත යුගයට අයත් ලෙන් ලිපි රාශියක් ලංකාව පුරා විවිධ ස්ථානවලින් හමුවෙයි. එයින් තෝරගත් ලෙන් ලිපි හැටක් පදනම් කරගනිමින් ඒවායේ පුද්ගල නාම, ග්‍රාම නාම හා තනතුරු නාමයන් විශ්ලේෂණය කළ අතර ඒවායේ නාමයන් වර්ගීකරණය, භාෂාමය ලක්ෂණ, අර්ථ හා සමාජ සන්දර්භ අනුව විග්‍රහ කිරීමක් සිදුවිය. එහිදී ප්‍රධාන වශයෙන් කොත්මලේ අමරවංශ හිමියන්ගේ "ලක්දිව සෙල්ලිපි" හා තිස්ස බණ්ඩාරයන්ගේ "සෙල්ලිපි විමසුම" යන කෘති ද්විතීක මූලාශ්‍රයන් ලෙස සලකා මෙහි දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. මෙම

---

[1] සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.
ireshasandeepani2001@mail.com

පර්යේෂණය සඳහා සංඛ්‍යාත්මක දත්ත රැස් නොකරන බැවින් මෙම පර්යේෂණය ගුණාත්මක ක්‍රමවේදය නියෝජනය කරන පර්යේෂණයකි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මෙම පර්යේෂණයෙන් හෙළිවූ ප්‍රධාන තතු අනුව, ප්‍රාකෘත භාෂාවෙන් ලියවූ ලිපිවල පවතින පුද්ගල නාම, ග්‍රාම නාම සහ තනතුරු නාම ක්‍රමෝපායික විශ්ලේෂණය මඟින් එම යුගයේ සමාජයේ ව්‍යුහය, ආගමික සහ රාජ්‍ය පදනම්, භාෂා සංවර්ධනය හා සංස්කෘතික හැඟීම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාදෙයි.

පුද්ගල නාමයන් විශ්ලේෂණය කිරීමේදී දැකිය හැක්කේ නාම තේමාවන් තුළ රාජකීය වංශානුගතත්වය, ආගමික ගරුත්වය සහ සත්පුරුෂ ගුණාංග වර්ණනය කිරීමට ඇති ප්‍රවණතාවය යි. උදාහරණයක් ලෙස, "දුට්ටගමණී", "මහසෙන", " අබය" වැනි නාමයන් දැක්වෙන්නේ වික්‍රමය, බලය හා ආරක්ෂාව වැනි කරුණු නිරූපණය වන අයුරිනි. එසේම මෙම නාමයන් බෞද්ධ දර්ශනික වටිනාකම්වලට අනුකූලව විකාශනය වී ඇති බව පැහැදිලිය. විශේෂයෙන්, "ශිල", "ශුමන", "ශුමය" වැනි ස්ත්‍රී නාම සංකල්පනාවන් තුළ පවා සත්ගුණ හා ආගමික සම්බන්ධතාවය නිරූපිතය. එසේම "තිශ", "රොනි", "නග", "දෙව", "හුමා", "කති" වැනි කෙටි ස්වර භාවිතයෙන් නිර්මාණය වූ නම් රාශියක් අනාවරණය වීම මගින් තත් යුගයේ කෙටි  නාමකරණයන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් හිමි වූ බවක්  දැකගත හැකිය. තවද නූතන නාමකරණයේදී පවා භාවිත කරන "උත්පලා", "විශාඛා", "සුමනා" වැනි නම් තත් යුගයේ වූ දීර්ඝ ස්වරයන්ගේ අභාවය පදනම් කරගනිමින් "උපල", "සුමන", "විශක" ලෙස දැකගත හැකි වීමද විශේෂත්වයකි. එසේම "කෙතක", " සදන", "වහබ" වැනි නම් තුළින් නූතනයේ නාමකරණයේදී භාවිත කරන ත්‍රිත්ව අක්ෂර  සංයෝගයද මනාව දර්ශනය වේ.

ග්‍රාම නාමයන් පිළිබඳව දක්නට ලැබෙන්නේ, ග්‍රාම නාම බෙදාහැරීම් ව්‍යුහය කෘෂිකාර්මික, භූගෝලීය හෝ ආගමික ආශ්‍රිත ව්‍යවස්ථාමය පදනමකින් ඇතිවී ඇති බවය. "නගපවත", " මලුගම", "හබුදගල", "තොටගමිය", "තිරගම", "කනගම" වැනි නාමයන් භූගෝලීය කලාප අනුව නිර්මාණය වී ඇති අතර, ඉන් බොහොමයක් රැකී රක්ෂා පදනම් කරගනිමින් නිර්මාණය වීම විශේෂත්වයකි. එසේම මෙමගින් පෙන්වන්නේ භූමි භාවිතය, ජනතා වෘත්තිය හා ආර්ථික ක්‍රියාකලාප සමඟ නාම නිර්මාණය බැඳී ඇති බවකි. මෙම ග්‍රාමයන්ගෙන් බොහොමයක් අද්‍යතනය වන විට ජනශූන්‍ය ප්‍රදේශයන්ව පැවතිය ද තත්කාලයේ ජනාකීර්ණ ප්‍රදේශ ලෙස  පැවති බවට මෙමගින් අනුමාන කළ හැකිය.

තනතුරු නාම පිළිබඳව විමර්ශනාත්මකව සලකා බලන කල, "පරුමක", " මහරඣහ", "අචරිය", "අමතිය" වැනි නාම පද භාවිතය රාජ්‍ය පාලන ක්‍රමය සහ ආගමික නායකත්වය අතර ඇති සංකීර්ණ සබඳතාවය අවබෝධ කරවයි. එසේම "ගවක", "මනිකර", "ස්වර්ණකර", "දනුඅචරිය", "ගනක", "පකර අදෙක" වැනි නම් මගින් තත් යුගයට අයත් වූ විශේෂිත රැකියා පිළිබඳව සාක්ෂි සපයයි. එසේම සැම

තරාතිරම පුද්ගලයෙක්ම ඇති හැකි පමණින් දානය සඳහා දක්වා ඇති කැමැත්ත ද මෙමගින් හඳුනාගත හැකිය.

ඉහත නාම වර්ගයන් තුළ පවතින භාෂාමය රටාවන් සලකා බලන විට, නාම නිර්මාණයේදී පද සන්ධි, උපසර්ග, නියෝගාත්මක ව්‍යුහය යෙදීමෙන් සිදු වූ භාෂා විකාශය පිළිබඳ නිරීක්ෂණයක් සිදු කළ හැකිය. මෙමගින් භාෂාව සම්ප්‍රදායෙන් සම්ප්‍රදායට පාරම්පරිකව විකාශනය වී ඇති ආකාරය හා සමාජ සංවර්ධනයත් සමඟ ඒකාකාරීව රූපීකෘත වී ඇති ආකාරය මනාව නිරූපණය කරයි.

## සමාලෝචනය

මෙම පර්යේෂණය ප්‍රාකෘත යුගයේ ලිපි වලින් අනාවරණය වූ පුද්ගල නාම, ග්‍රාම නාම හා තනතුරු නාම සෙවීම මඟින් එම සමාජයේ භාෂාමය ව්‍යුහය හා සමාජීය සංවිධානය පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කරයි. මෙම පර්යේෂණයෙන් දැක්වෙන ප්‍රධාන සූත්‍රය වන්නේ නාම පද භාවිතය හා සම්භාව්‍ය භාෂා විකාශය පිළිබඳව පමණක් නොව, සමාජයේ ආගමික, දාර්ශනික, ආර්ථික, හා රාජ්‍ය ක්‍රම සම්බන්ධතා පවා අවබෝධ කරවන භාෂාමය මාර්ගයක් වශයෙන් දැක්විය හැකි බවකි. එමගින්, ප්‍රාකෘත ලිපිවල නාම පද සංකල්පය මගින් එම යුගයේ ජීවන විලාසිතාව, සමාජ සංවිධානය, සහ සංස්කෘතික දෘෂ්ටිකෝණය පිළිබඳ නිර්මාණාත්මක හා විමර්ශනාත්මක අවබෝධයක් අද්‍යතන සමාජයට දායාද කරයි.

## ආශ්‍රිත මූලාශ්‍රය

අමරවංශ හිමි. කේ, (1998). ***ලක්දිව සෙල්ලිපි***. කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

බණ්ඩාර, වී. (2018). ***සෙල්ලිපි විමසුම***. කොළඹ 10: සේරි ප්‍රකාශන

විමලවංශ හිමි. (2000). ***සෙල්ලිපි සමාජය***. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය